**වවුනියාව නගර සභාව**
**වවුනියාව දිස්ත්‍රික්කය**
------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
---------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 18 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ඔක්තෝබර් 18 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කල මතය**
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට වවුනියාව නගර සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

අ). 1992 වර්ෂයේ දී ආරම්භ කළ නිදන් අරමුදලේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට, ශේෂය පොළිය සමඟ රු. 482,615 වුවත් මෙම අරමුදල ආරම්භ කිරීමේ අරමුණ හෝ පදනම මූල්‍ය වාර්තා වලින් අනාවරණය කර නොතිබුණි.

ආ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ ස්ථාවර වත්කම් යටතේ රු. 21,311,807 ක නිම නොවූ ඉදිකිරීම් වටිනාකමක් ඇතුලත් කර තිබූ බැවින් ස්ථාවර වත්කම් වල වටිනාකම එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

ඇ). වටිනාකම හෙළිදරවු නොකල බස් රථ 5ක්, ට්‍රේලර් සහිත ට්‍රැක්ටර 03 ක් හා වෙනත් යන්ත්‍රෝපකරණ 13 ක් විවිධ ආයතන වලින් නගර සභාවට ලැබී තිබූ නමුත්, එකී වත්කම් තක්සේරු කොට මූල්‍ය ප්‍රකාශන වලට ගලපා නොතිබුණි.

ඈ). රු. 3,956,379 ක් වූ ස්ථාවර තැන්පතු පොලී ආදායම මූල්‍ය ප්‍රකාශනවල රු. 3,978,130 ක් ලෙස දැක්වීමෙන් පොලී ආදායම රු. 21,751 කින් අධිගණනය වී තිබුණි.

ඉ). සමාලෝචිත වර්ෂයට අදාලව දැන්වීම් පුවරු මගින් ලද රු. 1,358,331 ක් ගිණුම්වල දක්වා තිබූ නමුත් එකී මුදල් කුමන කාල පරිච්ඡේද වලට අදාලද යන්න ගිණුම් තුලින් හෙළිදරවු කර නොතිබූ අතර,

දැන්වීම් පුවරු 54 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු රු. 533,950 ක වටිනාකමක් ආදායමට ගෙන නොතිබුණි. තවද එකී මුදල් ලැබිය යුතු ආදායම් ලෙසට ශේෂ පත්‍රයේ දක්වා නොතිබුණි.

ඊ). සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කඩකුලී ආදායම සහ ස්ථාවර තැන්පතු පොළී ආදායම මුදල් පදනම මත පිළියෙල කර තිබුණි.

උ). කඩ හිමියන්ගේ තැන්පතු ගිණුමේ ආරම්භක ශේෂය මූල්‍ය ප්‍රකාශනවලට හා උපලේඛණයට අනුව පිළිවෙලින් රු. 3,107,924 ක් හා රු. 3,181,444 ක් වුයෙන් රු. 73,520 ක වෙනසක් විය.

ඌ). 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කුඩිඉරිප්පු ළමා උද්‍යානය බාහිර ආයතනයකට බදු දීම මත ලැබිය යුතු රු. 200,000 ක ආදායම ගිණුම් වලට ගලපා නොතිබුණි.

එ). සමාලෝචිත වර්ෂයේ තැන්පත් කල රු. 20,000,000 ක ස්ථාවර තැන්පතුවට අදාල පොළිය මූල්‍ය ප්‍රකාශන වලට ගලපා නොතිබුණි.

ඒ). 2011 වර්ෂයේ සිට 2015 අගෝස්තු දක්වා ලැබිය යුතු රු. 45,706,668ක මුද්දර ගාස්තු ආදායම මූල්‍ය ප්‍රකාශන වලින් අනාවරණය කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳුණු ගිණුම්

---------------------

කඩ හිමියන්ගේ තැන්පතු ගිණුමේ ආරම්භක ශේෂය මූල්‍ය ප්‍රකාශනවලට හා උපලේඛණයට අනුව පිළිවෙලින් රු. 3,107,924 ක් හා රු. 3,181,444 ක් වුයෙන් රු. 73,520 ක වෙනසක් විය.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වු ආදායම රු. 48,873,451 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු. 31,484,368 ක් විය.

### 2.2 නීතී රීතී හා රෙගුලාසි වලට අනුකූල නොවීම.

-------------------------------------------------

පහත දැක්වෙන නීති රිතී හා රෙගුලාසි වලට හා කළමනාකරණ තිරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීතිරීති රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| <u>මුදල් රෙගුලාසි</u> | |
| මුදල් රෙගුලාසි 133 හා 134 | සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම හා අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 342 (1) | නගර සභාවේ වරිපනම් බදු එකතු කිරීම සඳහා යොදා ගනු ලබන රිසිට්පොත් හා තාවකාලික රිසිට් පොත් ලැබීම්, නිකුත් කිරීම් හා ආපසු බාරදීම කිසිදු වගකීමකින් තොරව සිදුකර තිබුණි. |
| මුදල් රෙගුලාසි 343 | සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂවල පාවිච්චි කල හා නොකල උප පත්‍රිකා පොත් අස්ථානගතවී ඇතත් ඒ සම්බන්ධ විනයානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 395 (ඌ) | මුදල් රෙගුලාසි වලට පටහැනිව නගර සභාවේ මුදල් පොත සැකසීම, චෙක්පත් ලිවීම හා බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම එක් නිලධාරියෙකු විසින් සිදුකර තිබුණි. |
| මුදල් රෙගුලාසි 571 (2) හා (3) | වසර 02 ක කාලය ඉකුත් එකතු වටිනාකම රු.1,614,484 ක් තැන්පතු 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායම බැර කිරීමට හෝ ආපසු ගෙවීමට සිදුකර නොතිබුණි. |
| <u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛණ</u> | |
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛණය | මාස 6කට වරක් ආයතනය සතු වාහන වල ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කලයුතු වුවත් නගර සභාවේ වාහන සම්බන්ධයෙන් එවැනි පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 බදු කුලී

අ). නගර සභාව සතු ජංගම කඩ හිමියන්ගෙන් දෛනිකව එකතු කල යුතු බදු කුලී ගාස්තු එකතු නොකිරීම මත 2013 වර්ෂයේ සිට පැවත එන රු. 140,500 ක මුදලක් තව දුරටත් හිඟව පැවතුනි.

ආ). නගර සභාව සතු වසර ගණනාවක සිට පැවත එන නවීන වෙළඳ පොලේ කුලී ලෙස අයවිය යුතු රු. 300,375 ක මුදලක් තව දුරටත් හිඟව පැවතුනි.

ඇ). නගර සභාව සතු බස් නැවතුම් පලෙහි පිහිටි කඩ වලින් ලැබිය යුතු රු. 305,325 ක් වූ කඩකුලී ආදායම වසර කීපයක සිට හිඟව පැවතුනි.

ඈ). නගර සභා බල ප්‍රදේශයේ පිහිටි භූමියේ නිත්‍ය අයිතිය තහවුරු නොවූ අනවසර කඩහිමියන් 6 දෙනෙකු විසින් කුලී ගාස්තු ලෙස වාර්ෂිකව රු. 798,000 ක මුදලක් වවුනියාව සමුපකාර සමිතියට ගෙවනු ලබන අතර එකී කඩ පිහිටි භූමියේ නිත්‍ය අයිතිය තහවුරු කර එම ආදායම නගර සභාවට ලබාගැනීමට හෝ අනවසර ඉදිකිරීමක් වන්නේ නම් ඒවා ඉවත් කිරීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

## 2.3.2 වෙළඳ බලපත්‍ර

---------------

අ). 2009 වර්ෂයේ සිට වෙළඳ ව්‍යාපාර බලපත්‍ර ගාස්තු සංශෝධනය කර අයකිරීමට කටයුතු නොකිරීම මත ආදායම් වර්ධනය කිරීමට ඇති අවස්ථා අහිමිවී තිබුණි.

ආ). ව්‍යාපාර වල ස්වභාවය අනුව වෙළඳ ව්‍යාපාර වර්ග කර දක්වා නොතිබූ අතර එකී ව්‍යාපාර වල ස්වභාවය අනුව එකී හිඟ බලපත්‍ර ගාස්තු ගණනය කිරීමේ ක්‍රම වේදයක් හඳුන්වා දී නොතිබුණි.

## 2.4 අධිභාර

--------

නගර සභාව සතු කඩ වලින් 2004 වර්ෂය සහ ඊට පෙර වර්ෂ වලින් ලැබිය යුතු රු 580,325 ක් වූ කඩකුලී ආදායම නිලධාරීන්ගේ අකාර්යක්ෂමතා හේතුවෙන් මෙතෙක් අයකරගෙන නොතිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

--------------------------

### 2.5.1 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

----------------------------------------

සභාව සතු ලොකු ට්‍රැක්ටර් 06 ක්, පාර තලනයක් හා අත් ට්‍රැක්ටර් 02ක් දීර්ඝ කාලයක සිට භාවිතයට නොගෙන ඌන උපයෝජිතව ගාල් කොට පැවතුණි.

### 2.5.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම

----------------------------------------

2014 ඔක්තෝබර් මස 17 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කල රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2014 හි 3.5 ඡේදය අනුව සෑම මුදල් වර්ෂයකම පෙබරවාරි 26 දිනට පෙර ඌනතා හා අතිරික්තතා වාර්තාව අනුව විනාශ කල යුතු භාණ්ඩ විනාශ කිරීම, අළුත් වැඩියා කලයුතු භාණ්ඩ අළුත් වැඩියාව හා වෙන්දේසි කලයුතු භාණ්ඩ වෙන්දේසි කර අවසන් කිරීම සිදුකල යුතු වුවත් 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් විකිණීමට තීරණය කල භාණ්ඩ වර්ග 123 ක්, විනාශ කිරීමට තීරණය කල භාණ්ඩ වර්ග 22 ක් හා අලුත් වැඩියා කිරීමට තීරණය කල භාණ්ඩ වර්ග 01 ක් ද සම්බන්ධයෙන් ඉහත මුදල් රෙගුලාසි පරිදි 2016 ජුලි 13 දින වනතුරුත් කටයුතු කර නොතිබුණි.

## 2.6 ආර්ථික නොවූ ගණුදෙනු

--------------------------

වවුනියාව එළවළු වෙළඳපොළේ ඉවතලන එළවළු යොදාගෙන කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියේ, 2015 වර්ෂයේ නිෂ්පාදන වල වටිනාකම රු. 7,980 ක් වූ අතර එකී නිෂ්පාදන වටිනාකම ලබා ගැනීම සඳහා කම්කරු වැටුප්, ආරක්ෂක සහ දුරකතන ආදී වියදම් වෙනුවෙන් රු. 1,303,560 ක වියදමක් දරා තිබුණි. ඒ අනුව එකී ව්‍යාපෘතිය පරිසර හිතකාමී සහ ලාභ අපේක්ෂා කළ නොහැකි ව්‍යාපෘතියක් වුවද ආදායම ඉක්මවා රු. 1,295,580 ක වැයක් දැරීම මගින් ව්‍යාපෘතිය අකාර්යක්ෂම බවට නිරීක්ෂණය විය.

2.7 **කොන්ත්‍රාත් පරිපාලනය**
-------------------------

අ). පන්ඩාරිකුලම සිට උළුක්කුලම දක්වා මාර්ගයේ පැවති පළලට වඩා අඩු පළලකින් යුතුව ගල් සහ තාර යොදා පිළිසකර කර තිබුණි.

ආ). පන්ඩාරිකුලම පලමු මාවත, ප්‍රමිතයකින් තොරව මීටර් 45 ක දුර ප්‍රමාණයක් ඉදිකිරීම වෙනුවෙන් රු. 279,000 ක පාඩුවක් දැරීමට සිදුවී තිබුණි.

ඇ). පත්තිනියාර් මහිලම්කුලම මාර්ගයේ උරහිස ඉදිකිරීමේදී ඉදිකල යුතු පළලට වඩා අඩු පළලකින් යුතුව ඉදිකර, සැලසුම්ගත ප්‍රමාණයටම ගෙවීම කිරීම මත රු. 10,057 මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

2.8 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**
-----------------------------

අ) වර්ෂ ගණනාවක සිට පැවත එන එකතු වටිනාකම රු.1,373,664 ක් වූ ණයගැති ශේෂ 04 ක් හා එකතු වටිනාකම රු.8,823,050 ක් වූ ණය හිමි ශේෂ 02 ක් නිරවුල් කිරීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ආ). නගර සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු හිමියන් විසින් එකී බදු හිමියන්ගේ ඉඩම් වල සිදුකරනු ලබන අනවසර ඉදිකිරීම් සඳහා 2000 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලය තුල බදු හිමියන් 13 දෙනෙකු වෙත ආපසු ගෙවිය යුතු රු. 827,508 ක මුදල ගිණුමේ බැරකමක් ලෙස දක්වා තිබූ නමුත් එම ඉදිකිරීම් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් මෙතෙක් ගෙන නොතිබුණි.

ඇ). විවිධ මිලදී ගැනීම් සඳහා 2009 වර්ෂයට පෙර සිට ලබා දී තිබූ රු. 74,083 ක අත්තිකාරම් මුදලක් විගණන දින වනතුරුත් නිරවුල් කර නොතිබුණි. තවද මේ සම්බන්ධයෙන් සහකාර පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් ලැබෙන තුරු සිටින බවද නගර සභාවේ ලේකම්වරයා විසින් පවසන ලදී.

ඈ). වවුනියාව නගර සභාවේ වරිපනම් බදු රැස්කිරීමේ ලේඛණගත ක්‍රමය අනුමැතියකින් තොරව නතර කර බදු තොරතුරු සැකසීම සහ වාර්තාගත කිරීම සඳහා පෞද්ගලික සමාගමකින් වසරකට රු. 180,000 ක ගිවිසුම්ගත මුදලකට පරිගණක මෘදුකාංගයක් මිලට ගෙන තිබූ නමුත් එම පරිගණක මෘදුකාංගය මඟින් හිඟ වරිපනම් බදු ආදායම් සහ අයවීම් පිළිබඳ ශේෂයන්ගේ විශ්ලේෂණයක් ලබා ගැනීමේ පහසුකම් නොමැති වීම මත එම පරිගණක මෘදුකාංගය මිලට ගැනීමේ අරමුණ ඉටු වී නොතිබුණි.

ඉ). 2009 පෙබරවාරි 19 දිනැති අංක 1589/20 දරන ගැසට් නිවේදනය මගින් නගර සභාව සතු නාගරික සංවර්ධන අධිකාරිය පාලනය කළ තානායම 2009 අප්‍රේල් 30 සිට නගර සභාවට පවරා දීමට කටයුතු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

i. මෙම චක්‍රලේඛයේ විධිවිධානයන්ට අනුව නගර සභාව විසින් එකී තානායම පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ii. නගර සභාව සතු උක්ත වටිනා දේපල (තානායම) 1980 වර්ෂයේ සිට මේ දක්වා පුද්ගලයෙකුට විධිමත් ටෙන්ඩර් කැඳවීමකින් තොරව ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් ආයතනය හරහා කොන්ත්‍රාත්තුව ලබා දී තිබුණි. ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් ආයතනය එම කල්බදු ගැණුම්කරුගෙන් අයකරන මාසික කුලියෙන් 70% ක මුදලක් පමණක් නගර සභාවට ගෙවන අතර එකී මුදල 2009 ජුනි 09 දින සිට රු. 38,500 කි. නගර සභාවේ ඍජු පාලනය යටතේ එකී දේපල පවරා ගෙන විධිමත් ප්‍රසම්පාදන පිළිවෙත් අනුව සුදුසු ගැණුම්කරුවෙකුට ලබාදෙන්නේ නම් උක්ත මුදලට වඩා වැඩි ආදායමක් ලබාගත හැකි බවත්, කළමණාකරණ ගාස්තු ගෙවීමේ අවශ්‍යතාවයක් නොමැති බවත් නිරීක්ෂණය කෙරේ.

iii. එකී තානායම් භූමියේ ගොඩනැගිලි කිහිපයක් ඉදිකර ඇතත් ඊට අනුමැතිය නගර සභාව වෙතින් ලබාගෙන නොතිබුණි.

iv. කල්බදු ගැණුම්කරුවෙකුට තානායම ලබා දී තිබියදී ඒ මත වරිපනම් බදු අයකිරීමට නගර සභාව මෙතෙක් කටයුතු කර නොතිබුණි.

v. තානායම් භූමිය වටා ඉදිකර ඇති තාප්පයේ එක් පැත්තකින් කඩා එකී භූමියේ වෙළඳසැලක් පවත්වාගෙන යන අතර, ඒ සඳහා නගර සභාව අවසරය ලබාදුන් බවට සාක්ෂි නොතිබුණි. තවද එම ඉදිකිරීම නගරයේ සහ එකී තානායමේ අලංකාරත්වයට හානි වියහැකි බවට ද නිරීක්ෂණය කෙරේ.

vi. නගර සභාව සතු තානායම නාගරික සංවර්ධන අධිකාරියට බදු දී ඇති අතර එමඟින් 2012 වර්ෂයේ සිට ලැබිය යුතු රු. 393,333 ක මුදලක් මෙතෙක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

ඊ). වවුනියාව නගර සභාව සතු ක්‍රීඩාපිටි 2ක් සහ ළමා උද්‍යානයක් බාහිර ආයතන/ සංවිධාන විසින් පරිහරණය කර ආදායම් උත්පාදනය කරනු ලබන නමුත් එකී ආදායම් ගණනය කර නගර සභාවට ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

උ). ආයතනයේ ගිණුම් වලට අනුව නිළධාරින් දෙදෙනෙකු විසින් ලබාගත් එකතුව රු. 38,695 ක් වූ අත්තිකාරම් ණය ශේෂයන් වසර ගණනාවක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඌ). විගණන නිලධාරීන් විසින් හඳුනාගෙන තිබූ ස්ථාන 14 ක අනවසර ඉදිකිරීම් 99ක් සිදුකර තිබූ අතර එකී ඉදිකිරීම් නාගරික සංවර්ධන අධිකාරියේ 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන (සංශෝධන) පනතේ විධානයන්ට අනුව එකී ඉදිකිරීම් ඉවත්කිරීමට කටයුතු කර නොතිබුණි.

එ). නගර සභා සීමාවේ ආයතන 5කින් සවිකර තිබූ දුරකතන කුළුණු ප්‍රමාණය හා ඒවායේ උස ප්‍රමාණය සැලකිල්ලට ගෙන ගිවිසුම්ගත වටිනාකම් එකී ආයතන වෙතින් මෙතෙක් අයකරගෙන නොතිබුණි.

ඒ). වවුනියාව නගර සභාවේ කන්දසාමි මාර්ගයේ පැවති පැරණි වැසිකිළි පද්ධතිය කිසිදු අනුමැතියකින් තොරව ඉවත්කර, එකී භූමියේ ඉදිකර ඇති කඩකාමර 3 ක් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සහ වර්තමානයේ පවතින මිල ගණන් වලට වඩා ඉතා අඩු මුදලකට (මසකට රු. 700 බැගින්) බදු දී තිබීම මත නගර සභාවට ලබාගත හැකිව තිබූ බදු කුලී ආදායම අහිමි වී තිබුණි.

ඔ). වවුනියාව නගර සභා ක්‍රීඩාංගනයේ A9 ප්‍රධාන මාර්ගයට මායිම්වූ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් භූමිය තුල එකි අධිකාරියේ අවසරයකින් තොරව උස මීටර් 1.2 ක් වූ දිග මීටර් 56 ක කොන්ක්‍රීට් කාණුවක් ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත් ආයතනය සමඟ රු. 851,510 ක මුදලකට ගිවිසුම්ගතව එකී ඉදිකිරීම් වෙනුවෙන් ගෙවීම් කිරීමට සැලසුම් කර තිබුණි. එමෙන්ම මෙම ඉදිකිරීම් ඉංජිනේරු සම්ප්‍රදායෙන් බැහැරව, පාදමක් රහිතව සහ විධිමත් සැලසුමකින් තොරව ඉදිකර තිබූ කානු පද්ධතියේ ෂටරින් වෙනුවෙන් රු. 89,994 ක අධි ඇස්තමේන්තුවක්ද සකස් කර තිබූ අතර, ඉදිකරනු ලැබූ කාණු පද්ධතියේ දුර ප්‍රමාණය සහ උස ප්‍රමාණය පූර්ව අනුමැතියකින් තොරව සම්පූර්ණයෙන්ම වෙනස් කර තිබුණි. එකී වෙනස්කම් සඳහා ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමට පෙර ඉදිකිරීම් නිමකර තිබුණි. ඒ අනුව එකී ඉදිකිරීම් වෙනුවෙන් ගෙවිය යුතු මුළු වටිනාකම ඉදිකිරීම් සම්බන්ධ වගකිව යුතු පාර්ශව වෙතින් අයකර ගෙවිය යුතු බවට නිරීක්ෂණය විය.

2.9 **කාර්ය සාධනය**

----------------

අ). අනුමත කාර්ය මණ්ඩල විස්තර වලට අනුව 2015 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩල ප්‍රමාණයන් ඉක්මවා නිලධාරීන්/ සේවකයින් 09 දෙනෙකුට රු. 3,774,078 ක මුදලක් ගෙවා තිබූ අතර තනතුරු 11 කට අදාල නිලධාරීන් 13 දෙනෙකුගේ පුරප්පාඩු මත එකී අංශවල වැඩ කොටස් වල ප්‍රගතිය පහල මට්ටමක පැවතිණි.

ආ). නගර සභාවේ රාජ්‍ය කළමණාකාර සේවයේ නියුතු නිළධාරිනියක් 2015 නොවැම්බර් 03 දින සිට වවුනියාව ගොඩනැගිලි දෙපාර්තමේන්තු කාර්යාලයට ස්ථාන මාරු කර තිබුණි. ඒ අනුව පළාත් පාලන ආයතනයක සේවකයෙකු වෙනත් දෙපාර්තමේන්තුවකට මාරු කිරීම විධිමත් නොවන බවත්, එකී දෙපාර්තමේන්තුවේ කරනු ලබන සේවාවන් වෙනුවෙන් නගර සභාව විසින් එකී නිලධාරිනියට වැටුප් ගෙවීම සදොස් බවත් නිරීක්ෂණය විය.

ඇ). විගණනයට ඉදිරිපත් කල උපලේඛණ අනුව නගර සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු ලාභීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වරිපනම් බදු ශේෂය රු.38,197,727 ක් වුවද වරිපනම් බදු ආදායම් අයවීමේ වාර්ෂික ප්‍රගතිය සැසඳීමේදී ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය පහල මට්ටමක පැවති බැවින් හිඟ ශේෂයන්ගේ වර්ධනයක් විය.

ඇ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 51,298,711 ක් වූ ණයගැති ශේෂයෙහි වරිපනම් බදු, කඩකුලී සහ විනෝද බදු ආදායම් වල වර්ෂ 5කට වැඩි හිඟ ශේෂයන්ගේ වටිනාකම රු.1,832,419 ක් විය.

2.10 **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

-------------------------------------

2.10.1 **අභ්‍යන්තර විගණනය**

---------------------

මුදල් රෙගුලාසි 133 ට අනුව සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණනය සිදුකර එහි වාර්තා මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3. **පද්ධති හා පාලනය**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින්වර නගර සභාවේ ලේකම්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමණාකරනය

(ඇ) ආදායම් පාලනය

(ඈ) රථවාහන පරිපාලනය

(ඉ) අභ්‍යන්තර පාලනය